මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
மத்திய மாகாண சபையின் அரச சேவைகள் ஆணைக்குழு
**Public Service Commission of Central Provincial Council**

අංක 244, කටුගස්තොට පාර, මහනුවර
இல. 244, கடுகஸ்தொட்டை வீதி, கண்டி
No. 244, Katugasthota Road, Kandy.

web site: *www.psc.cp.gov.lk*
e-mail: *psc.cp.gov@gmail.com*

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කාර්යාලය<br>காரியாலயம்<br>Office | 081-2213097 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 081-2213096 | සහකාර ලේකම්<br>உதவி செயலாளர்<br>Asst. Secretary | 081-5631321 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 081-2213082 |

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | CPC/PSC/10/SUP/LIMITED - 2025 | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2025.10. 21 |

මධ්‍යම පළාත් සභාවේ,
ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
ආයතන ප්‍රධානීන් වෙත,

**මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගය - 2025**

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද මගේ සමාංක හා 2025.09.19 දිනැති ලිපිය මඟින් ඉහත තරග විභාගයට අදාළ අභ්‍යන්තර විභාග නිවේදනය www.psc.cp.gov.lk වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කර ඇති අතර, එහි අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය ලෙස **2025.10.21** දින සඳහන් කර ඇත.

02. නමුත්, මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ II ශ්‍රේණියේ නිලධරයන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග නියමිත දිනට නොපැවැත්වීම හේතුවෙන් නියමිත කාලය තුළ කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්වීමට නොහැකි වූ නිලධාරීන්ට අගතියක් නොවන පරිදි, II ශ්‍රේණියට උසස් වී ඇති නමුත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ II ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වී නොමැති, මගේ සමාංක හා 2025.09.19 දිනැති ලිපියෙන්, අයදුම්පත් කැඳවා ඇති කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගය -2025ට අදාළ විභාග නිවේදනයේ සඳහන් අනෙකුත් සියලුම සුදුසුකම් සපුරා ඇති සහ මෙම කොමිෂන් සභාව විසින් අංක CPC/PSC/6/MSO/EB/2025 හා 2025.08.05 දිනැතිව අයදුම්පත් කැඳවා ඇති මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ II ශ්‍රේණියේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා අයදුම් කර ඇති නිලධරයන්ට, මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරඟ විභාගය -2025 සඳහා අයදුම් කිරීමට අවස්ථාව සලසා දීමට මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත.

03. එහිදී, කළමනාකරණ සේවා නිලධාරී සේවයේ II ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිට ඉන් සමත්වන සහ කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරඟ විභාගය -2025 පෙනී සිට ඉන් සමත්වන නිලධරයන් වෙත, පුරප්පාඩු සංඛ්‍යාව හා කුසලතා අනුපිළිවෙල අනුව පමණක් පත්වීම් ලබාදීම සම්බන්ධයෙන් සලකා බැලීමටත්, මෙකී විධිවිධානය පූර්වාදර්ශයක් නොවන පරිදි කටයුතු කිරීමටත්, මගේ අංක CPC/PSC/6/MSO/EB/2025 හා 2025.08.05 දිනැති ලිපියේ සඳහන් පරිදි 2025.08.29 දිනට පසුව අයදුම්පත් කැඳවනු ලබන මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ II ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගයක ප්‍රතිඵල මත, කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරඟ විභාගය -2025 යටතේ පත්වීම් ලැබීමට හිමිකමක් නොමැති බවටත් සඳහන් කරනු කැමැත්තෙමි.

අ.පි.බ. ට

04. ඒ අනුව, මෙම විභාගයේ අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය **2025.10.31** තෙක් දීර්ඝ කිරීමට කටයුතු කරන බවටත් විභාග නිවේදනයේ සඳහන් අනෙකුත් සියලුම කරුණු හා කොන්දේසි එලෙසින්ම ක්‍රියාත්මක වන බවටත් දැනුම් දෙන අතර, මේ සම්බන්ධයෙන් අදාළ සියලු නිලධරයන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසද කාරුණිකව දැනුම් දෙමි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි,

කේ.කේ.ජී.අයි.ඩී.පී. විජේතිලක,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.